# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1981/27 - 2016 අගෝස්තු මස 22 වැනි සඳුදා - 2016.08.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

#### 2016 මහියංගන ඇසළ උත්සවය

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ පළකර ඇති 1948 සැප්තැම්බර් 10 දතම අංක 9902 *ගැසට් පත්‍රයේ* ද, 1951 අගෝස්තු 17 දතම අංක 10283 *ගැසට් පත්‍රයේ* ද, 1955 මාර්තු 25 දතම අංක 14778 *ගැසට් පත්‍රයේ* ද, 1967 ජුනි 09 දතම අංක 14752 *ගැසට් පත්‍රයේ* ද පළවූ මහියංගන වන්දනා ගමන් පිළිබඳ ව්‍යවස්ථාව ද, 1992 අංක 58 දරන බලතල පැවරීම් (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත අනුව ද, මහියංගන ප්‍රදේශීය ලේකම් පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2016 මහියංගන ඇසළ උත්සව කඳවුර සම්බන්ධයෙන් පහත සඳහන් නියෝග පනවමි.

01. 2016 සැප්තැම්බර් මස 02 වැනි දින මහියංගන ඇසළ උත්සවය ආරම්භ වී, 2016 සැප්තැම්බර් 17 දින දිය කැපීමෙන් පසු අවසන් වන බව දනුම් දෙමි.

02. මහියංගන - බිබිල මහා මාර්ගයේ කි. මී. 37කණුව සිට මහියංගන ජාතික පාසල ඉදිරිපිට පිහිටි 1/39 බෝක්කුව දක්වා ද, මහියංගන රෝහල ඉදිරිපිට ඔරලෝසු කණුව අසළට වැටෙන මහියංගන, මීගහකිවුල මාර්ගය හා නව මාර්ගය අතර සේවා මාර්ග මැදිව පිහිටි භූමි භාගය වන්දනාකරුවන්ට ලැගුම් සඳහා වූ කඳවුර භූමිය වශයෙන් නම් කරමි.

03. විහාර මළුව, බෝමළුව, දේවාල භූමිය, පල්ලේ වීදිය යන ස්ථානයන් හා ඒ අවට භූමි භාගවල ආහාර පිසීම තහනම් කරමි.

04. මැද වීදියෙහි චෛත්‍යයට මුහුණලා ඇති බිම් තීරුවෙහි හා මකර තොරණට වම් පසින් පිහිටි බිම් තීරුවෙහි මා විසින් හෝ කඳවුර භාර නිලධාරී විසින් නිකුත් කරන ලද බලපත්‍ර මත මල්, සුවඳ කූරු, ඉටි පන්දම්, කපුරු, භාර ඔප්පු කිරීම සඳහා අවශ්‍ය රූප සහ පූජා භාණ්ඩ විකිණීම සඳහා අවසර දෙමි. ඉහත භාණ්ඩ විකිණීම ස්ථිර ගොඩනැගිලි 17 තුළ හැර ඉතිරි කොටසේ වෙළඳාම කිරීම සඳහා චෛත්‍යයට මුහුණලා ඇති බිම් තීරුවෙන් ඔබ්බට මෙයින් අවසර දෙමි.

05. මෙකී ඉහත දෙවන වගන්තිය සඳහන් කඳවුර භූමියේ මාගෙන් හෝ කඳවුර භාර නිලධාරීන්ගෙන් ලබාගත් බලපත්‍රපිට සාදන ලද තාවකාලික ගොඩනැගිලිවල හා දනට ඉදිකර ඇති ස්ථිර ගොඩනැගිලි 24හි වන්දනාකරුවන්ට කෑම බීම බෙදදීම සඳහා හෝ විකිණීම සඳහා ද වෙනත් වෙළඳ භාණ්ඩ විකිණීම සඳහා ද අවසර දෙමි. බස්නායක නිලමේතුමා විසින් දන්වීමකින් ප්‍රසිද්ධ කර ඇති පෙරහැර ගමන් මාර්ග වන පල්ලේවීදිය, මැද මාවත, දුටුගැමුණු විශ්‍රාම ශාලා මාවත,


1A - G 24076 — 32 (2016/08)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අම්මැඩිල්ල පාර, බදුල්ල - මහියංගන ප්‍රධාන පාර, බෝධිමළුව මාවත, සංඝාවාසය ඉදිරිපිට පාර, යන මාර්ගවල දෙපස ඇති වතුර බැස යන කාණුවේ සිට අඩි 20ක් ඔබ්බෙන් පිහිටි ප්‍රදේශය වෙළඳාම් කටයුතු සඳහා වෙන් කරමි.

06. සංඝමිත්තාරාමය අසළ ඔර්ලෝසු කණුවේ සිට බදුල්ල ප්‍රධාන මාර්ගයේ මකර තොරණ දක්වා දෙපස හා ස්ථිර වෙළඳසැල් ඉදිරිපිට වෙළඳාම් කිරීම තහනම් කරමි.

07. ඉහත අංක 04, 05 වගන්තිවලින් නියම කර ඇති පරිදි හැර, කඳවුර භූමිය ඇතුළත අන් කිසිම ස්ථානයක තාවකාලික වෙළඳකුටි ඉදිකිරීම හා ජංගම වෙළඳකුටි මගින් වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

08. ප්‍රධාන මාර්ගයේ පුද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුලුව සියලුම රථවාහන මගෙන් හෝ කඳවුර භාර නිලධාරී තැනගෙන් බලපත්‍රයක් නොමැතිව කඳවුරු භූමියට ඇතුල් කිරීම තහනම් කරමි.

09. මහියංගන - බිබිල මාර්ගයට මුහුණලා ඉදිකර ඇති වාහල්කඩ අසලින් පූජාභූමියට ඇතුල්වන මාර්ගය, මහියංගන - මීගහකිවුල පැරණි මාර්ගය, පූජා භූමියට ඇතුල්වීමට ඇති ප්‍රධාන පිවිසුම් මාර්ගය, රෝහල ඉදිරිපිට ඇති ඔරලෝසු කණුව අසලින් ඇති මාර්ගය සහ මහියංගන ජාතික පාසල ඉදිරිපිට ඇති 1/39 බෝක්කුව අසලින් ඇති මාර්ගවලින් කඳවුරු භූමිය තුළට වාහන අවසර පත්‍රයක් රහිතව කිසිම වාහනයක් ඇතුල් කිරීම තහනම් කරමි.

10. මා විසින් කඳවුරු භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් බදුදෙන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

11. බද්දට ගන්නා ලද වෙළඳ බිම්වල ඉදිකරනු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතු ය. මා විසින් නියම කරනු ලැබුවහොත් සෑම වෙළඳසැලක් අසලම වැසිකිලි 01ක් හෝ 02ක් ඉදිකළ යුතු ය. බිම් කොටස් බදු ගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු තමන්ගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු කඳවුර භූමිය තුළ පොලිතීන් ඇතුලු සියලුම අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතු ය.

12. මාගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම ගොඩනැගිල්ලක් ඉදිකිරීම තහනම් කරමි.

13. කිසිවකු විසින් ප්‍රාදේශීය ලේකම්තැනගෙන් අවසර ලබාගෙන මිස, වීදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන්කර තබන්නාවූ හෝ යම් බිමක් හෝ කඳවුරු ප්‍රදේශය තුළ ගං ඉවුරු මෙන් සෑදී තිබෙන්නාවූ යම් බිමක් ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ විශාල කිරීම නොකළ යුතු ය.

15 ව්‍යවස්ථාව

(අ) කිසිවකු විසින් ප්‍රාදේශීය ලේකම්තැනගෙන් අවසර ලබාගෙන මිස, වීදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන්කර තබන්නාවූ හෝ යම් බිමක් හෝ කඳවුරු ප්‍රදේශය තුළ ගං ඉවුරු මෙන් සෑදී තිබෙන්නාවූ යම් බිමක් අසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ විශාල කිරීම නොකළ යුතු ය.

(ආ) රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම් ය.

(ඇ) ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරීගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ දයක මුදල් එකතු කිරීම නොකළ යුතු ය.

පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
මහියංගනය.

09-234/1

**2016 මහියංගන ඇසළ උත්සවය**

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ පළකර ඇති 1948 සැප්තැම්බර් 10 දතම අංක 9902 ගැසට් පත්‍රයේ ද, 1951 අගෝස්තු 17 දතම අංක 10283 ගැසට් පත්‍රයේ ද, 1955 මාර්තු 25 දතම අංක 14778 ගැසට් පත්‍රයේ ද, 1967 ජුනි 09 දතම අංක 14752 ගැසට් පත්‍රයේ ද පළවූ මහියංගන වන්දනා ගමන් පිළිබඳ ව්‍යවස්ථාව ද, 1992 අංක 58 දරන බලතල පැවරීම් (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත අනුව ද, මහියංගන ප්‍රාදේශීය ලේකම් පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන වන මා වෙත මෙහි පහත සඳහන් ස්ථාන වන්දනාකරුවන්ට කෑම බීම බෙදදීම සඳහා හෝ විකිණීම සඳහා වෙන් කරමි.

(අ) මහියංගන - බිබිල පාරේ කි. මී. 37 සිට ජාතික පාසල ඉදිරිපිට ඇති 39/1 බෝක්කුව දක්වා ඇති ස්ථිර හා තාවකාලික ගොඩනැගිලි.

(ආ) මහියංගන - මීගහකිවුල පැරණි මාර්ගයේ රෝහල ඉදිරිපිට ඔරලෝසු කණුව දක්වා ඇති මාර්ගය දෙපස ඇති තාවකාලික හා ස්ථිර ගොඩනැගිලි.

(ඇ) කඳවුරු ප්‍රදේශයේ වන්දනාකරුවන් සඳහා ලැගුම් පිණිස වෙන්කර ඇති පිට්ටනියේ මාගෙන් ලබාගත් බලපත්‍රයක් මත සාදන ලද තාවකාලික ගොඩනැගිලි.

ඉහත සඳහන් ස්ථාන හැර කඳවුරු ප්‍රදේශය ඇතුළත අන්කිසි මොනයම් ස්ථානයක හෝ බිමක් බෙදදීම තහනම් වේ.

පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
මහියංගනය.

2016 සැප්තැම්බර් මස 18 වැනි දින,
මහියංගන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 234/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.